11244

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:-

1) සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
2) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති (1) (2) (3) (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
3) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

---

- **පහත සඳහන් සිද්ධිය ඇසුරින් 1 සිට 3 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

ජයදාස වසර 10 ක් පමණ ජනප්‍රිය කිරි නිෂ්පාදන ආයතනයක සේවය කිරීමෙන් අනතුරුව ඉන් ඉවත්ව යෝගට් නිෂ්පාදන ව්‍යාපාරයක් ආරම්භ කළේය. ප්‍රදේශයේ සිටින කිරි ගොවීන්ගෙන් කිරි මිලදී ගෙන යෝගට් නිෂ්පාදනය කරන ඔහු ගමේ වෙළෙන්දන්ට ඒවා අලෙවි කරයි.

(1) ජයදාස විසින් සපුරාලනු ලබන අවශ්‍යතාවත් හා වුවමනාවත් වන්නේ,
(i) ආහාර - යෝගට් (ii) යෝගට් - කිරි නිෂ්පාදන
(iii) කිරි නිෂ්පාදන - ආහාර (iv) සෞඛ්‍යය - යෝගට්

(2) සිද්ධියේ සඳහන් ජයදාසගේ යෝගට් ව්‍යාපාරය,
(i) භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
(ii) සේවා සපයන ව්‍යාපාරයකි
(iii) සෘජු නිෂ්පාදන ව්‍යාපාරයකි
(iv) ලාභ අරමුණු කර නොගත් ව්‍යාපාරයකි

(3) ජයදාසගේ ව්‍යාපාරයට ශක්තියක් වන්නේ,
(i) ප්‍රදේශයේ කිරි ගොවීන් සිටීම.
(ii) අවට ප්‍රදේශයේ වෙළෙඳසැල් පිහිටා තිබීම.
(iii) කිරි නිෂ්පාදන ව්‍යාපාරයක රැකියාව කිරීම තුළින් ලත් පළපුරුද්ද
(iv) යෝගට් සඳහා ඉල්ලුමක් පැවතීම.

(4) <u>කළුගල්</u> කඩා බෙදාහැරීමේ ව්‍යාපාරයක නිරත වූ <u>හිමිකරුවෙකු</u> ඉතා කාර්යක්ෂම <u>යන්ත්‍රයක්</u> විදේශයකින් ගෙන්වා එය ක්‍රියාකරවීමට තම දක්ෂතම <u>සේවකයින්</u> දෙදෙනෙකු යෙදවීම.

ඉරි ඇඳි පද වලට අදාල නිෂ්පාදන සාධන පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) ප්‍රාග්ධනය, ශ්‍රමය, භූමිය, ව්‍යවසාය
(ii) භූමිය, ව්‍යවසාය, ප්‍රාග්ධනය, ශ්‍රමය
(iii) භූමිය,ශ්‍රමය, ප්‍රාග්ධනය, ව්‍යවසාය
(iv) ව්‍යවසාය, භූමිය, ප්‍රාග්ධනය, ශ්‍රමය

- රජය ව්‍යාපාර කෙරෙහි මැදිහත් වන ආකාරය හා ඊට නිදසුන් පහත දැක්වේ.

| X තීරුව | y තීරුව |
|---|---|
| 1. හිතකර දිරිගැන්වීම් ලබාදීම | A. විදුලිය මහාමාර්ගය |
| 2. පාරිභෝගික ආරක්ෂාව | B. බදු සහන |
| 3. පරිසරය සුරකීම | C. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය |
| 4. යටිතල පහසුකම් | D. මධ්‍යම පරිසර අධිකාරිය |

(5) ඉහත X තීරුවේ තොරතුරු Y තීරුවේ තොරතුරු සමඟ ගැළපූ විට ,
නිවැරදි පිළිතුර වන්නේ,
(i) 1C,2B,3A,4D (ii) 1A,2B,3C,4D
(iii) 1B,2C,3D,4A (iv) 1D,2C,3B,4A

(6) ව්‍යාපාර කෙරෙහි ඇල්මැති පාර්ශවයන් ලෙස කළමනාකරුවන්ගේ අරමුණක් නොවන්නේ,
(i) ව්‍යාපාර අරමුණු ඉටු කරගැනීමට අවශ්‍ය කළමනාකරණ තීරණ ගැනීම.
(ii) කළමනාකරණ තීරණ ක්‍රියාත්මක කිරීම.
(iii) රැකියා වර්ධනය කිරීම.
(iv) ව්‍යාපාරයේ අනාගත වර්ධනය කිරීම.

(7) ව්‍යාපාරයකට "ව්‍යාපාර පරිසරය" වඩා වාසිදායක වන්නේ පහත සඳහන් කුමන අවස්ථා වලදී ද?
(i) අවස්ථා හා තර්ජන ඇතිවිට (ii) ශක්තීන් හා තර්ජන ඇතිවිට
(iii) ශක්තීන් හා අවස්ථා ඇතිවිට (iv) දුර්වලතා හා ශක්තීන් ඇතිවිට

ව්‍යාපාර සංවිධාන කෙරෙහි බලපාන පනත් කීපයක් පහත දැක්වේ.
A. 1890 හවුල් ආඥාපනත
B. 2007 අංක 7 දරණ සමාගම් පනත
C. 1840 වංචා වැළැක්වීමේ ආඥා පනත
D. 1972 අංක 05 දරණ සමුපකාර සමිති පනත

(8) මින් හවුල් ව්‍යාපාර කෙරෙහි බලපාන පනත් වනුයේ,
(i) A පමණි (ii) A,B,C පමණි (iii) A හා C පමණි (iv) ඉහත සියල්ලම

(9) රාජ්‍ය සංස්ථා වල දක්නට ලැබෙන රාජ්‍ය දෙපාර්තමේන්තු වල දක්නට නොලැබෙන ලක්ෂණයක් වන්නේ,
(i) අයිතිය හා පාලනය රජය සතුවීම (ii) අඛණ්ඩ පැවැත්මක් නොතිබීම
(iii) රජයේ මූල්‍ය රෙගුලාසි වලට යටත් වීම (iv) නෛතික පුද්ගලභාවයක් තිබීම


(10) ටෙලි බැංකු සේවා තුළින් ඉටුකර ගත නොහැකි කාර්යයන් වන්නේ,
(i) බැංකු ගිණුමේ ශේෂය පිරික්සීම (ii) චෙක් පොත් ලබා ගැනීම
(iii) බැංකු ගිණුම් ප්‍රකාශන ලබාගත හැකි වීම (iv) විදුලි බිල්පත්, ජල බිල්පත් ගෙවා දැමීම

(11) පසන් තම ව්‍යාපාරික ගනුදෙනු පහසුකරගැනීමේ අරමුණින් චෙක්පත් මගින් ගනුදෙනු කිරීම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට අදහස් කළේය. ඒ සඳහා ඔහු යා යුතු බැංකුව වන්නේ,
(i) ජාතික ඉතිරි කිරීමේ බැංකුව (ii) ශ්‍රී ලංකා මහ බැංකුව
(iii) ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (iv) සී/ස හැටන් නැෂනල් බැංකුව.

- රක්ෂණයට සම්බන්ධ කරුණු කීපයක් පහත දැක්වේ.
  A. ස්වාමිපුරුෂයාට තම නීත්‍යානුකූල භාර්යාව රක්ෂණ කළ හැකිය.
  B. රක්ෂණ දේපලකට වන්දි ලැබෙනුයේ හානිය යථාතත්වයට පත්කිරීමට පමණි.
  C. රක්ෂකයා හා රක්ෂිතයා රක්ෂණ ගිවිසුමට අදාළ සියලු තොරතුරු හෙළිදරව් කළ යුතුයි.

(12) ඉහත කරුණු වලට අදාළ රක්ෂණ මූලධර්ම පිළිවෙලින් දැක්වෙන්නේ,
(i) රක්ෂ්‍ය හිමිකම, හානිපූරණය, උපරිම විශ්වාසය
(ii) උපරිම විශ්වාසය, ආදේශකය, රක්ෂ්‍ය හිමිකම
(iii) රක්ෂණ හිමිකම, උපරිම විශ්වාසය, හානිපූරණය
(iv) හානි පූරණය , උපරිම විශ්වාසය, රක්ෂන හිමිකම

සන්නිවේදන ක්‍රියාවලියට අදාළ රූපසටහන පහත දැක්වේ.



(13) ඉහත A,B,C හිස්තැනට අදාළ පිළිතුර පිළිවෙලින් දැක්වෙන්නේ,

(i) පණිවිඩය, මාධ්‍යය, ප්‍රතිචාරය (ii) මාධ්‍යය, පණිවිඩය, ප්‍රතිචාරය

(iii) පණිවිඩය, ප්‍රතිචාරය, මාධ්‍යය (iv) මාධ්‍යය, ප්‍රතිචාරය, පණිවිඩය

කළමනාකරණ කාර්යයන්ට අදාල තොරතුරු කීපයක් පහත දැක්වේ.

A. ව්‍යාපාර අරමුණු අපේක්ෂිත අයුරින් ඉටුකර ගැනිම කාර්යක්ෂමභාවය නම් වේ.

B. ව්‍යාපාර අරමුණු තීරණය හා ඒවා ඉටුකර ගැනිම සඳහා සුදුසු ක්‍රියාමාර්ග තීරණය කිරීම සම්බන්ධ ක්‍රියාවලිය සැලසුම්කරණය වේ.

C. සැලසුම් ක්‍රියාත්මක කිරීමේදී මානව සම්පත් නිසිලෙස හැසිරවීමේ ක්‍රියාවලිය සංවිධානකරණයයි.

D. කටයුතු සැලසුම් කර අයුරින් ඉටුවී දැයි සොයා බලා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාවලිය පාලනයයි.

(14) ඉහත තොරතුරු වල,

(i) A,B සත්‍ය වන අතර B,C අසත්‍ය වේ (II) A,C අසත්‍ය වන අතර B, D සත්‍ය වේ

(iii) A,D සත්‍ය වන අතර B,C අසත්‍ය වේ (iv) A,B,C සත්‍ය වන අතර D අසත්‍ය වේ

(15) අලෙවි කරණ මිශ්‍රයේ ප්‍රවර්ධන විචල්‍යයට අයත් සාධක ඇතුළත් පිළිතුර නිවැරදිව දැක්වෙන්නේ,

(i) ප්‍රචාරණය, ගුණත්වය, මෝස්තරය, විකුණුම් ප්‍රවර්ධනය

(ii) පෞද්ගලික අලෙවිය, විකුණුම් ප්‍රවර්ධනය, වට්ටම්, මහජන සම්බන්ධතා

(iii) විකුණුම් ප්‍රවර්ධනය, ප්‍රචාරණය, පෞද්ගලික අලෙවිය, මහජන සම්බන්ධතා

(iv) ප්‍රචාරණය, ගුණත්වය, අංගෝපාංග, මෝස්තරය

- සුබෝධ තම රැකියාවෙන් විශ්‍රාම ගත් පසු ලැබූ අර්ථසාධක අරමුදල යෙදවීමට අදහස් කරයි. ඔහුගේ අපේක්ෂා පහත පරිදිය.
  - ස්ථාවර පොලී ප්‍රතිශතයක් යටතේ පොලී ආදායමක් ලැබීම.
  - ඕනෑම හදිසි අවශ්‍යතාවයකදී මුදල් බවට පත්කර ගැනීම.
  - ආයෝජනය සම්බන්ධව පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම.

(16) සුබෝධට සුදුසු ආයෝජන මාර්ගය වන්නේ,

(i) කොටස් මිලට ගැනීම (II) ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම

(iii) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීම (iv) භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම

(17) ගිණුම්කරණයේ මූලික අරමුණ වන්නේ,

(i) ව්‍යාපාරයේ සීමිත සම්පත් පාලනය කිරීම.

(ii) මූල්‍ය තත්වය සතුටුදායකද යන්න දැනගැනීම

(iii) ඇල්මැති පාර්ශව වලට තීරණ ගැනිමට අවශ්‍ය තොරතුරු සැපයීම

(iv) නීතිමය අවශයතා ඉටු කිරීම

(18) ව්‍යාපාරයක සිදුවන ගනුදෙනු නිසා,

(i) වත්කම් ඇතිවේ (II) වියදම් ඇතිවේ

(iii) වගකීම් ඇතිවේ (iv) ඉහත සියල්ලම ඇතිවේ

(19) කිසියම් ව්‍යාපාරයකට අයත් වත්කම් සියල්ල එහි අයිතිකරු විසින් සපයා ඇති විටෙක ගිණුම්කරණ සමීකරණය වන්නේ,

(i) වත්කම් = හිමිකම් + වගකීම් (II) වත්කම් = වගකීම් -හිමිකම්

(iii) වත්කම් - හිමිකම් = වගකීම් (iv) වත්කම් = හිමිකම්

කිසියම් දිනකට ව්‍යාපාරයක ගිණුම්කරණ සමීකරණය පහත දැක්වේ.

වත්කම් = හිමිකම් + වගකීම්

150, 000 = 100, 000 + 50 ,000

(20) රු. 25000/= බඩු තොගයක් ණයට ලබා ගැනීමෙන් පසු ගිණුම්කරණ සමීකරණයේ අගයන් නිවැරදිව දක්වා ඇත්තේ,

| | වත්කම් = හිමිකම් + වගකීම් | | වත්කම් = හිමිකම් + වගකීම් |
|---|---|---|---|
| (i) | 150 000 = 100 000 + 50 000 | (II) | 175 000 = 125 000+ 50 000 |
| (iii) | 175 000= 100 000+ 75 000 | (iv) | 125 000= 100 000+ 25 000 |

- ව්‍යාපාරයක සිදුවූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ. ඒවා ඇසුරින් 21, 22 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A) රු.25,000 ක කාර්යාල උපකරණ මුදල් දී මිලට ගැනීම.
B) රු. 10,000 ක මුදලක් ණයගැතියකුගෙන් ලැබීම.
C) බැංකු ණය පොලිය රු. 2,000 ක් මුදලින් ගෙවීම.
D) ණයහිමියන්ට රු.5000 ක මුදලක් ගෙවීම.

(21) වත්කම් වලට පමණක් බලපාන ගනුදෙනු වන්නේ,
(i) A හා B (II) B හා C (iii) C හා D (iv) A පමණි

(22) වත්කමක් හා හිමිකමක් අඩුවන ගනුදෙනුව වන්නේ,
(i) A (II) B (iii) C (iv) D

- විරාත්ගේ ව්‍යාපාරයේ 2015 වර්ෂය සඳහා තොරතුරු කීපයක් පහත දැක්වේ.

| | |
|---|---|
| 2015/1/1 දිනට ප්‍රාග්ධනය | රු. 150 000 |
| වර්ෂය කළ වියදම් | රු. 75 000 |
| වර්ෂය තුළ ආදායම් | රු. 100 000 |
| වර්ෂය තුළ කළ ගැනිලි | රු. 15 000 |
| අගෝස්තු 30 දින යෙදවූ අමතර ප්‍රාග්ධනය | රු. 25 000 |

(23) 2015/12/31 දිනට අයිතිකරුගේ හිමිකම වන්නේ,
(i) රු. 200 000 (ii) රු. 185 000 (iii) රු. 290 000 (iv) රු. 190 000

- පහත X තීරුවේ මූලික සටහන් පොත්ද Y තීරුවේ මූලාශ්‍ර ලේඛනය දැක්වේ.

| X | Y |
|---|---|
| i. මුදල් පොත | A ජනල් වවුචරය |
| ii. බැංකු ගිණුම | B ගැණුම් ඉන්වොයිසිය |
| iii. ගැණුම් ජනලය | C ගෙවීම් වවුවර |
| iv. විකුණුම් ජනලය | D ලදුපත |
| v. පොදු ජනලය | E විකුණුම් ඉන්වොයිසිය |

(24) X තීරුවේ මූලික සටහන් පොත් Y තීරුවේ මූලාශ්‍ර ලේඛණ සමග අනුපිළිවෙලින් ගැළපූ විට ලැබෙන පිළිතුර වනුයේ,
(i) DCABE (II) DABCE (iii) DCBEA (iv) DBECA

(25) ද්විත්ව කාර්යයන් ඉටුකරන මූලික සටහන් පොත් දැක්වෙන්නේ,
(i) ගැණුම් ජර්නලය හා බැංකු ගිණුම (II) මුදල් පොත හා පොදු ජර්නලය
(iii) බැංකු ගිණුම හා මුදල් පොත (iv) බැංකු ගිණුම හා විකුණුම් ජර්නලය

(26) ණය හිමියෙකුට රු. 20,000/= ක ණය පියවීමේ දී5% වට්ටමක් ලැබුණි. ලද වට්ටම්වලට අදාළ ද්විත්ව සටහන වන්නේ,
(i) මුදල් පොත හර 1,000
ලැබූ වට්ටම් ගිණුම බැර 1,000
(ii) ණයහිමි ගිණුම හර 19,000
මුල් පොත බැර 19,000
(iii) ණයහිමි ගිණුම හර 20,000
මුදල් පොත බැර 19,000
ලද වට්ටම් ගිණුම බැර 1,000
(iv) ණය හිමි ගිණුම හර1000
ලද වට්ටම් ගිණුම බැර 1000

11272

(27) බැංකු ගිණුම් සංශෝධනය කිරිමට අදාළ ගනුදෙනුව තෝරන්න.
(i) නිකුත්කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු . 1,000/=
(ii) ස්ථාවර නියෝග මත බැංකුව ගෙවන ලද රු. 3,000/= ලීසිං වාරිකය
(iii) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 4,000/=
(iv) බැංකුව විසින් ගිණුමට වැරදි ලෙස බැර කර තිබූ රු . 1,500/=

(28) කලිඳුගේ ව්‍යාපාරයේ 2015.3.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු. 370/= ක් වූ අතර 4/1 දින රු. 630/= අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන ලදී. මැයි මාසයේ සිට අග්‍රිමය රු. 500 කින් වැඩි කිරිමට තීරණය කළේ නම් නව සුළු මුදල් අග්‍රිමය කොපමණද?
(i) රු 1500/= (ii) රු 1000/= (iii) රු 1130/= (iv) රු 630/=

(29) කලණගේ ව්‍යාපාරයේ 2015/12/31 සංශෝධිත බැංකු ගිණුමේ ශේෂය රු. 17500/= ක් වූ අතර එදින බැංකු ප්‍රකාශයේ ශේෂය රු. 15000 ක් විය. මෙයට හේතු වූ ගනුදෙනුව වන්නේ,

(i) බැංකුව අයකළ බැංකු ගාස්තු රු . 2,500/=
(ii) ස්ථාවර නියෝග මත ගෙවූ රක්ෂණ වාරික රු. 2,500/=
(iii) නිකුත් කළ නමුත් බැංකුව ඉදිරිපත් නොකළ චෙක් රු. 2,500/=
(iv) තැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත් රු. 2,500/-

- සිල්ලර වෙළඳ ව්‍යාපාරයක් පවත්වාගෙන යන සඳමිණි ගේ ව්‍යාපාරයේ සිදුවූ ගනුදෙනු කීපයක් පහත දැක්වේ.

A. අත්පිට මුදලට භාණ්ඩ මිලට ගැණුම් රු. 5,000/=
B. සරසි සමාගමෙන් ලී බඩු උපකරණ මිලට ගැනුම් රු. 7,000/=
C. උදාරගේ භාණ්ඩ තොගයක් මිලට ගැනුම් රු. 6,500/=
D. සඳමිණි පෞද්ගලික ප්‍රයෝජනය සඳහා භාණ්ඩ ගැනුම් රු. 2,000/=

(30) ඉහත ගනුදෙනු වලින් පොදු ජනලයේ සටහන් වන ගනුදෙනු වනුයේ,
(i) A හා B (II) B හා C (iii) B හා D (iv) C හා D

(31) අවිනිශ්චිත ගිණුමේ සටහන් කළ යුතු ගනුදෙනුවක් වන්නේ පහත දැක්වෙන කිනම් ගනුදෙනුවද?
(i) රු. 2000/= ක විකුණුම් ඉන්වොයිසියක් රු. 20000/= ක් ලෙස විකුණුම් ජනලයේ සටහන් වීම.
(ii) අත්පිට ගැනුම් රු. 15000/= ක් දෙවරක් ගිණුම් වල සටහන් වීම.
(iii) රු. 1000/= ක විදුලි ගාස්තු ගෙවීම රක්ෂණ ගාස්තු ගිණුමට හරකර තිබීම.
(iv) රු. 3000/= ක දුරකථන ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම.

(32) ව්‍යාපාරයක වැරදි නිවැරදි කිරිමේ ජනල් සටහනක් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| දුන් වට්ටම ගිණුම හර | 1500 | |
| ලද වට්ටම ගිණුම හර | 1500 | |
| අවිනිශ්චිත ගිණුම | | බැර 3000 |

මීට අදාල සංලක්ෂය වනුයේ,

(i) දුන් වට්ටම් රු 1500 ලද වට්ටම් ගිණුමට සටහන් කර තිබීමේ වරද නිවරදි කිරිම.
(ii) ලද වට්ටම් රු. 1500 දුන් වට්ටම් ගිණුමට සටහන් කර තිබීමේ වරද නිවරදි කිරිම.
(iii) දුන් වට්ටම් හා ලද වට්ටම් ගිණුම්වල සටහන් නොවීමේ වරද නිවරදි කිරිම.
(iv) දුන් වට්ටම 1500 ක්ද ලද වට්ටම 1500 ක්ද වැඩියෙන් සටහන් විමේ වරද නිවැරදි කිරිම.

(33) කරුණාගේ ව්‍යාපාරයේ 2015/12/31 දින පිළියෙල කළ ශේෂ පිරික්සුමේ ලැබූ ගොඩනැගිලි කුලී රු18,000 ක් විය. එදිනට පිළියෙල කළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ ලැබිය යුතු ගොඩනැගිලි කුලී ලෙස රු. 6000 ක් සඳහන්ව තිබුණි.

ව්‍යාපාරයේ වාර්ෂික ගොඩනැගිලි කුලී ආදායම වන්නේ,
(i) රු. 12000 කි. (II) රු. 24000 කි. (iii) රු. 18000 කි. (iv) රු. 6000 කි.

(34) ව්‍යාපාරයක රු. 500,000 ක් පිරිවැය වූ යන්ත්‍රෝපකරණ වාර්ෂිකව සරළ මාර්ග ක්‍රමය මත 5% කින් ක්ෂය කිරිමට තීරණය කරන ලදී. යන්ත්‍ර ක්ෂය වීමට අදාළ ද්විත්ව සටහන වන්නේ,

(i) යන්ත්‍ර ක්ෂය ගිණුම හර 25,000
යන්ත්‍ර ගිණුම බැර 25,000

(ii) යන්ත්‍ර ගිණුම හර 25,000
යන්ත්‍ර ක්ෂය ගිණුම බැර 25,000

(iii) යන්ත්‍ර ක්ෂය ගිණුම හර 25,000
යන්ත්‍ර ක්ෂය වෙන්කිරිමේ ගිණුම බැර 25,000

(iv) යන්ත්‍ර ක්ෂය වෙන්කිරිමේ ගිණුම හර 25,000
යන්ත්‍ර ක්ෂය ගිණුම බැර 25,000

(35) මිතුරු තරු ක්‍රීඩා සමාජයේ 2015.01.01 දිනට සාමාජික සංඛ්‍යාව 200 කි. එකී සාමාජිකයෙකුගේ වාර්ෂික සාමාජික ගාස්තුව රු. 100 කි. 2015 වර්ෂය සඳහා සාමාජිකයින් 193 ක් සාමාජික ගෙවා ඇත. සාමාජිකයින් දෙදෙනෙක් පසුගිය වර්ෂයේ සාමාජික මුදල් මෙම වර්ෂය තුළ ගෙවා ඇති අතර සාමාජිකයින් තිදෙනෙක් ඉදිරි වර්ෂය සඳහා ද 2015 වර්ෂය තුළ සාමාජික මුදල් ගෙවා ඇත.

2015 වර්ෂයේ ලැබිම් හා ගෙවීම් ගිණුමේ සහ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කල යුතු සාමජික මුදල් ප්‍රමාණය පිළිවෙලින් දැක්වෙන පිළිතුර වනුයේ,

(i) රු. 20000 සහ රු. 19500

(ii) රු. 20000 සහ රු. 200000

(ii) රු. 19300සහ රු. 20000

(iv) රු. 19800 සහ රු. 20000

(36) විසිතුරු ලී කැටයම් නිෂ්පාදන ආයතනයක් පවත්වාගෙන යන සචින්ගේ ව්‍යාපාරයේ ලී කැටයම් නිෂ්පාදනයට අදාළවියදම් පහත දැක්වේ.

දැව සඳහා රු. 30,000
කැටයම් ශිල්පීන්ට වැටුප් ගෙවීම රු. 10,000
විදුලි වියදම් 5,000
යන්ත්‍ර නඩත්තු වියදම් 2,000
ඇසුරුම් වියදම් 3,000
මුරකරු වැටුප් 4,000
තීන්ත වැලි කඩදාසි 5,000
ගොඩනැගිලි කුලී 6,000

මෙම ව්‍යාපාරයේ ප්‍රාථමික පිරිවැය වන්නේ,
(i) රු. 35000 (ii) රු. 40000 (iii) රු. 43000 (iv) රු. 39000

- පහත සඳහන් තොරතුරු උපයෝගී කර ගනිමින් 36 සිට 40 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  දිල්ෂාන්ගේ වෙළඳ ව්‍යාපාරයේ 2015/12/31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කල ශේෂ පිරික්සුම පහත දැක්වේ.

| | හර (රු) | බැර (රු) |
|---|---|---|
| 2015/12/31 දිනට ඉතිරි තොගය | 5000 | |
| ගැනුම් | 75000 | |
| ගොඩනැගිලි (පිරිවැය) | 300000 | |
| වෑන්රථ (පිරිවැය) | 200000 | |
| විදුලි ගාස්තු | 5000 | |
| විකුණුම් සේවක වේතන | 20000 | |
| බැංකු ණය පොලී | 2000 | |
| ණයගැතියෝ | 10000 | |
| බොල්ණය | 2000 | |
| පරිපාලන වේතන | 30000 | |
| මුදල් ශේෂය | 25000 | |
| විකුණුම් | | 200000 |
| 10% බැංකු ණය | | 30000 |
| 2015/1/1 වෑන් රථ ක්ෂය වෙන්කිරීම | | 20000 |
| ලැබූ ගොඩනැගිලි කුලී | | 5000 |
| ණයහිමියෝ | | 11000 |
| බැංකු අයිරාව | | 8000 |
| ප්‍රාග්ධනය | | 400000 |
| | 674000 | 674000 |

අම්තර තොරතුරු පහත දැක්වේ.

- 2015.12.31 දිනට ඉතිරි බඩු තොගයේ පිරිවැය රු. 7000/= කි.
- අයිතිකරු රු. 2000 ක් පිරිවැය වූ භාණ්ඩ පෞද්ගලික ප්‍රයෝජනයට ගෙන ඇතත් කිසිදු සටහනක් තබා නැත.
- වෑන් රථ පිරිවැය මත 10% බැගින් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කළ යුතුව ඇත.

(37) මෙම ව්‍යාපාරයේ විකිණීමට ඉදිරිපත් කළ භාණ්ඩවල පිරිවැය වනුයේ,
(i) රු. 78000 (ii) රු. 80000 (iii) රු. 82000 (iv) රු. 71000

(38) මෙහි ජංගම වගකීම් පමණක් ඇතුළත් පිළිතුර වන්නේ,
(i) ණයහිමියෝ , බැංකු අයිරාව (ii) ණයහිමියෝ , බැංකු අයිරාව, උපචිත ණය පොලී
(iii) ණයහිමියෝ, බැංකු ණය (iv) ණයහිමියෝ, බැංකු ණය , බැංකු අයිරාව

(39) මෙම ව්‍යාපාරයේ 2015/12/31 දිනෙන් අවසන් වර්ෂයට දළ ලාභය වන්නේ,
(i) රු. 131,000 (ii) රු. 12,7000 (iii) රු. 129,000 (iv) රු. 134,000

(40) මෙම ව්‍යාපාරයේ 2015/12/31 දිනෙන් අවසන් වර්ෂයට ශුද්ධ ලාභය වන්නේ,
(i) රු. 52,000 (ii) රු. 58,000 (iii) රු. 56,000 (iv) රු. 54,000

11329
11330

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ව්‍යාපාර අධ්‍යනය හා ගිණුම්කරණය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

➤ **පළමුවන ප්‍රශ්නය ඇතුළුව 1 කොටසෙන් ප්‍රශ්න දෙකක්ද 11 කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.**

(1) පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න I සිට IV දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සොයන්න.

විශ්‍රාමලත් පාසල් ගුරුවරයකු වන පෙරේරා මහතා "ආසිරි පොත්හල" නමින් පාසල් පොත් හා ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යයි. ප්‍රධාන පෙළේ පාසලක් ආසන්නයේ පවත්වාගෙන යනු ලබන මෙම ව්‍යාපාරයේ පාසල් ලිපිද්‍රව්‍ය සඳහා පාසල් ප්‍රජාවගෙන් විශාල ඉල්ලුමක් පවති. සැලසුමකට අනුව රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් අවශ්‍ය ද්‍රව්‍ය තොග වශයෙන් මිලට ගෙන , සාධාරණ මිලට පාරිභෝගිකයින් වෙත අලෙවි කිරීමෙන් ඉහළ කිර්තිනාමයක් ලබාගෙන සිටි.

(i) (අ) මෙහි සඳහන් නිෂ්පාදිත දෙකක් නම් කරන්න.
(ආ) මෙම නිෂ්පාදිත, කුමන මූලික අවශ්‍යතාවයක් ඉටුකරනු ලබන්නේද?
(ii) (අ) ඉහත සිද්ධියේ සඳහන් වන ව්‍යාපාර සංවිධාන වර්ග දෙක නම් කරන්න.
(ආ) තොග වෙළඳාමේ ලක්ෂණයක් සඳහන් කරන්න.
(iii) (අ) පෙරේරාගේ ව්‍යාපාරයේ දැකිය හැකි ව්‍යාපාරික අවස්ථාව කුමක්ද?
(ආ) මෙම ව්‍යාපාරයට අරමුදල් සම්පාදනය කරගත හැකි මාර්ග දෙකක් ලියන්න.
(iv) ව්‍යාපාරයක් නිෂ්පාදිත අලෙවිය වැඩිකර ගැනීම සඳහා නොයෙක් උපක්‍රම භාවිතා කරයි. එවැනි උපක්‍රම දෙකක් සඳහන් කරන්න.

පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන v සිට x දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

2016.01.01 දින පෙරේරා මහත්මියද, පෙරේරා මහතාගේ පොත් සාප්පුව අසලින් දේශීය ආහාර ද්‍රව්‍ය අලෙවි කිරීමේ ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී. එදින ඇය සතුව තිබූ රු. 100,000 ක ස්ථාවර තැන්පතු මුදලද රු. 20,000 වටිනා ශීතකරණයද ව්‍යාපාරයට යෙදවිය. එදිනට රු. 25,000 ක ලී බඩුද ණයට ගන්නා ලදී. මෙම ව්‍යාපාරය සඳහා ආහාර සැකසීම සඳහා මනා පළපුරුද්දක් ඇති සේවකයකු ද බඳවා ගන්නා ලදී.
2016 පළමු සතිය තුළ සිදුවූ ගණුදෙනු පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| 2016.01.02 | ණයට ගැනුම් (ආහාර ද්‍රව්‍ය) | 5000 |
| 01.02 | අත්පිට ගැනුම් | 4000 |
| 01.03 | අත්පිට විකුණුම් | 2500 |
| 01.04 | කඩකුලී ගෙවීම් | 2000 |
| 01.04 | ව්‍යාපාරයේ ප්‍රයෝජනය සඳහා උපකරණ මිලට ගැනුම් | 15000 |
| 01.05 | ණයට විකුණුම් | 2000 |
| 01.06 | අයිතිකරුගේ ගැනිලි (භාණ්ඩ) | 1000 |
| 01.07 | සේවක වැටුප් ගෙව්වා | 5000 |

(v) 2016.01.01 දිනට මෙම ව්‍යාපාරයේ මූලික ගිණුම්කරණ සමීකරණය අගයන් සහිතව ලියා දක්වන්න.
(vi) ලී බඩු ණයට ගැනීමට අදාල ද්විත්ව සටහන අගයන් සහිතව ලියා දක්වන්න.
(vii) (අ) මෙම ව්‍යාපාරයේ ජංගම නොවන වත්කම්වල වටිනාකම කොපමණද?
(ආ) 2016.01.07 දිනට අදාල මුළු වගකීම්වල වටිනාකම කොපමණද?
(viii) වියදම් හැරුණු විට මෙම ව්‍යාපාරයේ අයිතිකරුගේ හිමිකම අඩුවීමට තුඩුදුන් ගණුදෙනුවක් ලියා දක්වන්න.
(ix) මෙම ව්‍යාපාරයේ ගනුදෙනු සටහන් කිරීමට උපයෝගී කරගන්නා මූලික පොත් දෙකක් හා ඒවාට අදාල මූලාශ්‍ර ලේඛන ලියා දක්වන්න.
(x) 2016.01.07 දිනට පෙරේරා මහත්මියගේ ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද?

(ලකුණු 02x10=20)

## I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

➤ ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.

(2) (i) මිනිස් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප වුවමනා ලෙස හැඳින්වේ.;
අ) ව්‍යාපාරයක් යනුවෙන් කුමක් අදහස් වේද?
ආ) ව්‍යාපාරවල පොදුවේ දැකිය හැකි අරමුණු දෙකක් සඳහන් කරන්න. (ල.02)

(ii) පහත දැක්වෙන ප්‍රකාශ සත්‍යද, අසත්‍යද යන්න දක්වන්න.
අ) ව්‍යාපාරයකට ඇල්මැති පාර්ශ්ව දක්වන උනන්දුව එහි අභිවෘද්ධියට හානිකරය.
ආ) ව්‍යාපාරයක් සාර්ථකවීමට ව්‍යාපාර පරිසරය පිළිබඳව නිරන්තරයෙන් අධ්‍යයනය කළ යුතුය.
ඉ) එකම පාරිභෝගික වුවමනා සපුරා ගැනීම සඳහා වුවද, ව්‍යාපාර විසින් විවිධ භාණ්ඩ නිෂ්පාදනය කෙරේ.
ඊ) මිනිසා විසින් සකස් කරන ලද , නිෂ්පාදනයේ දී ආධාර කරගන්නා දෑ "ප්‍රාග්ධනය" ලෙස හැඳින්වේ. (ල.02)

(iii) අ) ඇල්මැති පාර්ශවයක් ලෙස ව්‍යාපාරයක අයිතිකරුවන්ගේ අරමුණු දෙකක් ලියා දක්වන්න. (ල.01)
ආ) සේවකයන් විසින් ව්‍යාපාරයට ලබාදෙන දායකත්වය සඳහා නිදසුන් දෙකක් ලියන්න. (ල.02)

(iv) හිමිකාරත්වය හා අරමුණු අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කර දක්වන්න. (ල.02)

(මුළු ලකුණු 08)

(3) මැද පෙරදිග රටවලට තේ අපනයනය කිරීමේ ව්‍යාපාරයක් පවත්වාගෙන යන රසික රු. 2,000,000 ක් වටිනා ඔහුගේ ලොරි රථය එම වටිනාකමට ශ්‍රී ලංකා රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත. තේ ප්‍රවාහනය කරමින් සිටියදී මෙම රථය හදිසි අනතුරකට භාජනය විය. රසික විසින් මේ බැව් රක්ෂණ සමාගමට දැනුම් දීමෙන් අනතුරුව වන්දි වශයෙන් රු. 500 000 ක මුදලක් දීමට එකඟ විය.

(i) අ) ඉහත සිද්ධියට අදාල වන රක්ෂණ මූලධර්මය කුමක්ද?
ආ) විදේශ වෙළඳාමේ නිරත රසිකට ලබාගත හැකි රක්ෂණ ඔප්පු වර්ග දෙකක් සඳහන් කරන්න. (ල.02)

(ii) අ) තේ අපනයනය සඳහා සුදුසු යැයි ඔබ යෝජනා කරන ප්‍රවාහන මාර්ගය හා ඊට අදාල මාධ්‍ය නම් කරන්න.
ආ) මැද පෙරදිග රටවල් ගනුදෙනු කිරීමේ දී තොරතුරු හුවමාරු කර ගැනීමට යොදාගත හැකි සන්නිවේදන මාධ්‍යයන් 2 ක් ලියන්න. (ල.02)

(iii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.
අ) ස්ථාවර තැන්පතුව ඇපයට තබා තැන්පතුවෙන් යම් ප්‍රතිශතයක් ණය මුදලක් ලෙස ලබා ගත හැක.
ආ) ස්කයිප් (Skype) මගින් තොරතුරු සන්නිවේදනය කිරීම, විද්‍යුත් / වාචික/ ලිඛිත යන ස්වරූප 3 ට අදාල වේ.
ඉ) හවුල් ව්‍යාපාරයක සිටිය යුතු අවම හා උපරිම සාමාජික සංඛ්‍යාව හවුල් ආඥා පනතට අනුව තීරණය වේ.
ඊ) ණයපතක් ලබා ගැනීමට බැංකු ගිණුමක් තිබීම අවශ්‍ය වේ. (ල.02)

(iv) වර්තමානයේ ජංගම දුරකථනය හා අන්තර්ජාලය භාවිතා කරමින් ව්‍යාපාර කටයුතු වල යෙදීම බහුලව දක්නට ලැබේ.
අ) ජංගම දුරකථන බැංකු ක්‍රමයේ වාසි තුනක් ලියන්න.
ආ) පරිගණක ආශ්‍රිතව සිදුවන ගිණුම්කරණයේ අවාසි දෙකක් ලියන්න. (ල.02)

(4) (i) අ) ඵලදායකත්වය යනුවෙන් කුමක්ද අදහස් කෙරේද? (ල.01)

ආ) අලෙවිකරණය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.01)

(ii) පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ) කළමනාකරණය යනු කාර්යයන් කිහිපයකින් යුත් අඛණ්ඩ ක්‍රියාවලියකි.

ආ) යහපත් වෘත්තීය සම්බන්ධතා පවත්වා ගැනීම තුළින් සේවකයන් තම කාර්යයන් ඉටු කිරීමට පෙළඹවීම සංවිධානකරණය නම් වේ.

ඉ) සැලසුම් කල පරිදි නිෂ්පාදන හා අලෙවි කටයුතු සිදු නොවේ නම් එයට හේතු සොයා බැලීම පාලනයයි.

ඊ) ව්‍යාපාරයට ආකර්ෂණීය ලෙස මෙන්ම ලාභදායීව තෘප්තිමත් කළ හැකි පාරිභෝගිකයින්ගෙන් සමන්විත වෙළඳපළ ඉලක්ක වෙළඳපළ ලෙස හඳුන්වයි.

(iii) නිමි ඇඳුම් නිෂ්පාදනය කරන ව්‍යාපාරයක් විසින් අනුගමනය කළ කළමනාකරණය කිහිපයක් පහත දැක්වේ.

A. නියමිත ප්‍රමිතියකට අනුකූල දැයි සොයා බැලීම.

B. සේවකයින්ට පහසුකම් ලබාදෙමින් ඔවුන් දිරිමත් කිරීම.

C. නවීන මැෂින් 10 ක් ආනයනය කිරීමට තීරණය කිරීම.

D. නව සේවකයින් බඳවා ගෙන ඔවුන්ට තනතුරු හා බලතල ලබාදීම.

ඉහත පියවර කළමනාකරණ ක්‍රියාවලියේ එක් එක් කාර්යය යටතේ දක්වන්න. (ල.02)

(iv) පුද්ගලයන් තමා උපයන ආදායමෙන් ඉතිරිකරගත් මුදල් ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂාවෙන් ඵලදායි මාර්ගවල යෙදවීම ආයෝජනයක් නම් වේ.

අ) 1. සුදුසු ආයෝජන මාර්ගයක් තෝරා ගැනීමේ දී සලකා බලන සාධකයක් ලියන්න. (ල. $^1/_2$) යි

2. ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීමෙන් ලැබෙන ප්‍රතිලාභයක් ලියන්න. (ල. $^1/_2$) යි

ආ) 1. ශ්‍රී ලංකා විනිමය හා සුරැකුම්පත් කොමිෂන් සභාව කුමන වෙළෙඳපළක් විධිමත්ව පවත්වා ගෙන යාම සඳහා නියාමනය කෙරේද? (ල. $^1/_2$) යි

2. භාණ්ඩාගාර බිල්පත් අලෙවියේ දී ප්‍රාථමික වෙළඳුන් වශයෙන් බහුලව කටයුතු කරන්නේ කුමන ආයතනද? (ල. $^1/_2$) යි

(ල. 02x04 = 08)

## II කොටස - ගිණුම්කරණය

**(මෙම කොටසින් ප්‍රශ්න දෙකකට පමණක් පිළිතුරු සපයන්න.)**

(5) (i) අ) ගිණුම්කරණය කෙටියෙන් හඳුන්වන්න. (ල.01)

ආ) වගකීමක දැකිය හැකි ලක්ෂණ 2 ක් ලියන්න. (ල.01)

(ii) සමීරගේ ව්‍යාපාරයේ මාර්තු මාසය තුළ සිදුවී ඇති ගනුදෙනු වලින් ගිණුම්කරණ සමීකරණයට වූ බලපෑම් පහත දැක්වේ.

| දිනය | වත්කම් | = | හිමිකම | + වගකීම |
|---|---|---|---|---|
| 3/1 | + 500,000 | | + 500,000 | |
| 3/3 | + 20,000 | | | + 20,000 |
| 3/5 | + 5,000 | | + 5,000 | |
| 3/12 | - 3,000 | | | - 3,000 |

අවශ්‍ය වන්නේ,

ඒ ඒ දිනයන්හි සිදුවී ඇතැයි උපකල්පනය කල හැකි ගනුදෙනු වටිනාකම් සහිතව දක්වන්න.

(iii) සුධීරගේ ව්‍යාපාරයේ 2016.01.01 දිනට පහත සඳහන් ශේෂ දක්නට ලැබුණි.

ණයගැති ශේෂය හර රු. 50 000

මුදල් ශේෂය හර රු. 10 000

2016.01.05 ණයගැතියන්ගෙන් ලැබු මුදල රු 20,000 යි.

අඩුකළ වට්ටම රු. 1,000 කි.

2016.01.08 ණයගැතියන්ගෙන් රු 100,000 ක මුදල් ලැබීමේ දී අඩුකල වට්ටම 5%

අවශ්‍ය වන්නේ,

ඉහත ගනුදෙනු මුදල් පොතේ සහ අදාළ ලෙජර් ගිණුම් වල සටහන් කර තුලනය කිරීම.
(මුදල් පොතේ නිවැරදි ආකෘතිය භාවිතා කරන්න.) (ල.04)

(iv) නදීරගේ ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයට අදාළ ගනුදෙනු පහත දැක්වේ.

| දිනය | ඉන්වොයිසිය අංකය | ගැනුම්කරු | වටිනාකම රු |
|---|---|---|---|
| 2016.01.07 | 045 | අනිල් | 15550 |
| 2016.01.08 | 067 | සුනිල් | 17825 |
| 2016.01.09 | 089 | කමල් | 14850 |

අවශ්‍ය වන්නේ,

අ) ජනවාරි මාසයට අදාළ විකුණුම් ජනලය පිළියෙල කිරීම.
ආ) අදාළ ලෙජර් ගිණුම් පිළියෙල කිරීම. (ල.04)

(6) (i) අ) නිෂ්පාදන පිරිවැය යනු කුමක්ද? (ල.01)
ආ) බැංකු සැසඳුම ප්‍රකාශය හඳුන්වන්න. (ල.01)

(ii) කුමාර ලී බඩු නිෂ්පාදන ව්‍යාපාරයක් පවත්වා ගෙන යයි. ඔහු විසින් 2016 ජනවාරි මාසයේ පුටු 100 ක් නිෂ්පාදනය සඳහා දරන ලද පිරිවැය පහත දැක්වේ.

| (පිරිවැය ලේඛනයක් මගින්) | රු. |
|---|---|
| ලී සඳහා | 600,000 |
| වේවැල් සඳහා | 15,000 |
| මුරකරු වැටුප් | 30,000 |
| යන්ත්‍ර ක්ෂය | 2,500 |
| වඩු කාර්මික වැටුප | 60,000 |
| විදුලිය | 6,500 |
| ගොඩනැගිලි කුලිය | 10,000 |

එක් පුටුවක් 20% ලාභාන්තිකයක් ලබාගෙන විකිණීමට අපේක්ෂා කරන්නේ නම්, පුටුවක විකුණුම් මිල සොයන්න. (ල.02)

(iii) මිනෝල් ව්‍යාපාරයේ 2016 ජනවාරි මාසයේ 31 දිනම බැංකු ගිණුමේ රු. 40,000 කි. එහෙත් එදිනට බැංකු ප්‍රකාශයේ ශේෂය මීට වෙනස්විය. වෙනසට හේතු පහත දැක්වේ.

- ජනවාරි මාසය තුළතැන්පත් කළ නමුත් නිෂ්කාශනය නොවූ චෙක්පත රු. 8,000 කි.
- මෙම මාසයේ දී නිකුත් කළ නමුත් මෙතෙක් බැංකුවට ඉදිරිපත් නොකළ චෙක්පත් රු. 7,000 ක් විය.
- බැංකුව අයකරගෙන තිබූ බැංකු ගාස්තු රු. 150 කි.
- ස්ථාවර නියෝග මත ගෙවූ, ජනවාරි මස රක්ෂණ වාරිකය රු. 500 කි.
- බැංකුව වෙත ණයගැතියන් සෘජුවම ප්‍රේෂණය කර තිබූ මුදල රු. 3500 කි.

අවශ්‍ය වන්නේ,

අ) බැංකු ගිණුමේ ශේෂය සංශෝධනය කිරීම.
ආ) 2016.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කර එදිනට බැංකු ප්‍රකාශයේ පැවැති ශේෂය දැක්වීම. (ල.04)

(iv) මිහිරිගේ ව්‍යාපාරයේ 2016.01.031 දිනට සකස්ළකල ශේෂ පිරික්සුම තුලනය නොවූයෙන්, එහි වෙනස රු. 1300 අවිනිශ්චිත ගිණුමේ බැර පැත්තේ සටහන් කරන ලදී. ගිණුම් පොත් පරීක්ෂාවෙන් පහත වැරදි අනාවරණය විය.

- දුන් වට්ටම රු. 1200 ශේෂ පිරික්සුමට පිටපත් කර නොතිබීම.
- රු. 1250 ක ගෙවූ ගෙවල් කුලී ගිණුම් දෙකෙහිම හර කර තිබීම.
- ණයගැතියකුගෙන් ලැබුණු රු. 3000 ක මුදල පිළිබඳව පොත්වල දෙවරක් සටහන් වී තිබීම.